දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2014 පරීක්ෂණය - 2017 ඔක්තෝබර්
Bachelor of Arts General (External) Degree Part II 2014 Examination – October 2017

ආවිසා 3.1 - ප්‍රායෝගික ආර්ථික විද්‍යාව
ECG 3.1 - Applied Economics

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

---

01. (i) 1977 අග භාගයෙන් පසුව හඳුන්වාදුන් ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් අත්පත් කර ගැනීමට සමත් වූ සාර්ථකත්වයන් කවරේ ද? පැහැදිලි කරන්න.
(ලකුණු 10 යි)

(ii) මෙම ලිහිල් ආර්ථික ප්‍රතිසංස්කරණයන්ට අනුව සැලකිය යුතු ප්‍රමාණයකින් සිදුවූ ව්‍යුහාත්මක වෙනස්කම් ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික සංවර්ධනයට කෙතරම් දුරට හිතකර වන්නේ ද?
(ලකුණු 10 යි)

02. (i) වත්මන් ශ්‍රී ලංකා ආර්ථිකයේ අභියෝගයන් ලෙස ඔබ හඳුනා ගන්නේ මොනවා ද?
(ලකුණු 08 යි)

(ii) ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික සංදර්භය තුළ සෘජු විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ වැදගත්කම හා වාසි පැහැදිලි කොට එහි ආකර්ෂණය සීමා වීමට බලපෑ ඇති හේතු සාකච්ඡා කරන්න.
(ලකුණු 12 යි)

03. (i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායන් පාඩු ලබන හා දුර්වල වීමට බලපෑ ඇති හේතු සාධක මොනවා ද? පැහැදිලි කරන්න.
(ලකුණු 14 යි)

(ii) පාඩු ලබන රාජ්‍ය ආයතන ප්‍රතිසංවිධාන කිරීමෙහිලා ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද?
(ලකුණු 06 යි)

04. (i) මෑත කාලීන ශ්‍රී ලංකාවේ විදේශීය වෙළඳාමේ ව්‍යුහයෙහි හටගෙන ඇති ප්‍රධාන වෙනස්කම් සංඛ්‍යා ලේඛන උපයෝගී කර ගනිමින් සාකච්ඡා කරන්න.
(ලකුණු 10 යි)

(ii) ශ්‍රී ලංකාවේ 2015 වන විට සාර්ථක ලෙස අත්පත් කර ගත් සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ මොනවාදැයි පුළුල්ව සාකච්ඡා කරන්න.
(ලකුණු 10 යි)

05. "1990 සිට 2015 වන විට දරිද්‍රතාව හරි අඩකින් අඩුකිරීමේ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථය සපුරා ගෙන ඇති ශ්‍රී ලංකාව වර්තමානයේ දී ප්‍රාදේශීය විෂමතා හා ආදායම් අසමානතා සඳහා විසඳුම් සොයන අතර තිරසාර සංවර්ධන අභිමතාර්ථවල පළමු අභිමතාර්ථය වන සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරුකිරීමේ අභියෝගයට මුහුණ පා සිටී' (ශ්‍රී ලංකා මහ බැංකුව, 2015)

(i) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මැනීම සඳහා බහුලව භාවිතා කළ හැකි ජාතික හා ජාත්‍යන්තර මිනුම් මොනවා ද? කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 04 යි)

(ii) 2006/07 - 2012/13 කාලසීමාවේ ශ්‍රී ලංකාවේ ආංශික හා ජාතික දරිද්‍රතා මට්ටමෙහි උපනතීන් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(iii) දිගුකාලීනව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මොනවා ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

06. (i) පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ උපත් අනුපාතිකය හා මරණ අනුපාතිකය පහළ වැටීමට බලපාන ලද සාධක ගෙන හැර දක්වන්න.

(ලකුණු 04 යි)

(ii) පසුගිය දශක කිහිපයක් තුළ ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය වර්ධනය වීමට බලපාන ලද හේතු මොනවා ද?

(ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ තරුණ, කාන්තා හා ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත කාණ්ඩ අතර පවතින ඉහළ සේවා වියුක්තිය ආර්ථිකයේ දිගින් දිගටම පවතින බරපතල ප්‍රශ්නයක් බවට පත්වීම සඳහා බලපාන ප්‍රධාන හේතු කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04 යි)

(iv) ප්‍රමාණාත්මක දත්ත උපයෝගී කරගනිමින් මෑතකාලීනව දකුණු ආසියානු කලාපයේ ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන මට්ටම හා එහි උපනති පිළිබඳ විමර්ශනයක් කරන්න.

(ලකුණු 08 යි)

07. (i) වර්තමානයේ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමෙහි විචලන මිනුම් කිරීම සඳහා අදාළ කරගත හැකි මිල දර්ශක පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 08 යි)

(ii) මෑත වර්ෂවලදී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමෙහි විචලන සඳහා හේතු සාධක වූ කරුණු ගෙන හැර දක්වන්න.

(ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාව ඇතුළුව සංවර්ධනය වෙමින් පවතින රටවල උද්ධමනය පාලනය කිරීමට යොදා ගත හැකි ප්‍රතිපත්ති පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු 06 යි)

08. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) මූල්‍ය අන්තර්ගතභාවය (Financial Inclusion)

(ii) වයස් ව්‍යුහ සංක්‍රාන්තිය (Age structure transition)

(iii) ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධනයේ අභියෝග

(iv) ශ්‍රී ලංකාවේ 2016 අංක 6 දරණ ක්ෂුද්‍රමූල්‍ය පනත

(5x4 = ලකුණු 20 යි)

ශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශශ